# තපුරු නංගී



ඩබ්.ඩබ්.ඩී.දෙවන්ෂා

# තපුරු තංගී

© කතෘ ප්‍රකාශනයකි

පළමු මුද්‍රණය 2023 නොවැම්බර් 15

ISBN 978-624-206-899-2

කතාව සහ චිත්‍ර

**ඩබ්.ඩබ්.ඩී.දෙවන්ෂා**

2 E, මහමායා බාලිකා විද්‍යාලය

කතෘගේ වෙනත් කෘති

රතු පැංචා

සුදුවා සහ කළුවා

# පිදුම..

මට අකුරු කියවූ මගේ ආදරණීය තාත්තාටත්,
නිතරම මා ලඟින්ම සිටින ආදරණීය අම්මාට සහ
මාගේ අක්කාටත්, මට අකුරු උගන්වා හොද නරක
කියා දී, මෙවැනි නිර්මාණ කිරීමට මාව යොමුකල
මාගේ ගුරුවරිය වන චාමිනී පල්ලියගුරු
ගුරුතුමියටත් මාගේ පොත උපහාරයක්ම වේවා...

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්තකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක්වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතිකඅවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික ස්මාට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ගේ අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතටය එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමිව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන් මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන්අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර
2023.10.20



ඔන්න එක ලස්සන
වත්තක් මැද පුංචි
ගෙදරක් තිබුණා.මේ
ගෙදර හිටියේ අම්මයි,
අක්කයි,නංගී
කෙනෙකුයි.

මෙයාලගේ වත්තේ එක
තැනක තිබුණා කූඹි
ගුලක්. ඉතිං එයාලා හරිම
සතුටින් තමයි කාලය
ගතකලේ.



එක දවසක් අක්කයි නංගියි වත්තෙ ඇවිදිමින් ඉද්දි දැක්කා කූඹි රංචුව බත් ඇටයක් අරගෙන යනවා.





ඉතිං ඒක දැකපු මේ

දෙන්නා හැමදාම කූඹි

ගුල ළඟට බත් ඇට

දාන්න පටන් ගත්තා.

දැන් ඉතිං මේ කූඹි

යාළුවෝ මෙයාලා එක්ක


හොඳට යාළුයි.

ඔහොම ටික දවසක් යද්දී
අක්කට අසනීප වෙලා
එයා හිටියේ ඇඳේ. ඉතිං
එදා කූඹින්ට කෑම දාන්න
ගියේ නංගි .



එයා කූඹියන්ට කෑම දීල ඒවා අරගෙන යන දිහා බලාගෙන හිටියා .


එහෙම ඉද්දී එයාට හරි නපුරු දෙයක් හිතුණා.






එයා කෝටුවක් අරගෙන අර කූඹි යාළුවෝ හිටපු ගුලට ඇන්නා. අනේ ඉතිං මේ කූඹි යාළුවන්ට හොඳටම රිදුණා. ගුල ඇතුළේ හිටපු අයගේ අත්, කකුල්, ඔළුව කැඩිලා ගියා.

එයාලා ඉක්මණින්ම ගිහින් කූඹි රැජිනට මේ ගැන කීවා.රැජින කිව්වා ඒ නපුරු ළමයට පහර දෙන්න කියලා.





ඊට පස්සේ කූඹියෝ
කෝටුව දිගේ ගිහින්
නංගිගේ අත හැපුවා.
හොඳටම රිදුණු නංගී මහ
හයියෙන් අඬන්න
ගත්තා.

අම්මා එතනට දුවගෙන ආවා. සිදුවී ඇතිදේ වටහා ගත්තා. අඬන නංගිව සනසන ගමන් අම්මා මෙහෙම කිව්වා.



"පුංචි දූවේ, කවුරු හරි කෙනෙක් ඔයාට කෝටුවකින් ගැහුවොත්, ඔයාට රිදෙනවා නේද?"

නංගි ඔව් කිව්වා.





“අන්න ඒ වගේ තමයි සතුන්ටත් වේදනාව දැනෙන්නේ. අපි ඒ අයට හිංසා නොකර ඉන්න පුරුදු වෙමු".

නංගී අම්මාට ඔළුව සලා

එය පිළිගත්තා.

ආයෙනම් කවදාවත් ම

සතුන්ට හිංසා කලේ නෑ.



නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20